# ඉතිහාසය

## 8 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය
(2017 සිට ක්‍රියාත්මක වේ)



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශය

# 8 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk    විද්‍යුත් තැපැල : info@nie.lk

**ඉතිහාසය**

**8 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2017**

© **ජාතික අධ්‍යාපන ආයතනය**

ISBN **..............**

**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

**මුද්‍රණය :** **මුද්‍රණාලය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**ශ්‍රී ලංකාව**

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී

පර්යේෂණ වලින් අනාවරණය වූ කරුණු දා අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථකව නිරත වීම පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි. නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ දා ආයතන සභාවේ දා රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතය බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකවරුන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළමගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය මගින් ඉගෙනුම් පල වෙත සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකිය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යවරුන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

**විෂය විශේෂඥ සභය**

| | |
|---|---|
| මහාචාර්ය මාලනී ඇදගම | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br>(සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය ඉන්ද්‍රාණී මුණසිංහ | කොළඹ විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය පත්මසිරි කන්නන්ගර | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |

**ලේඛක මණ්ඩලය (බාහිර)**

| | |
|---|---|
| කේ.එස්. රංජනී | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ |
| කේ.වී.එස් විජයමාලා | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, කැලණිය |
| එච්.එම්. නලින් බණ්ඩාර | කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය, කුරුවිට |
| මේරි ඩොනේටා කන්‍යා සොයුරිය | නියෝජ්‍ය විදුහල්පති (විශ්‍රාමික)<br>ශාන්ත අන්තෝනි ජාතික පාසල, වත්තල |
| එම්.එච්.එම්.යාකුත් | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| රෙස්ටා ප්‍රියන්ති ප්‍රනාන්දු | විද්‍යාත්මක සහකාර<br>පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය |

**ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)**

| | |
|---|---|
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| ඩබ්.එස්.එස් ගුණවර්ධන | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

| | |
|---|---|
| **භාෂා සංස්කරණය** | ශ්‍රීනාත් ගනේවත්ත මයා |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට පාසල් විෂය මාලාවේ හර විෂයයක් ලෙස ක්‍රියාත්මක වූ ඉතිහාසය 2015 වර්ෂයේ සිට එලෙස ම ක්‍රියාත්මක වන අතර 6 - 9 ශ්‍රේණි සඳහා සතියකට කාල පරිච්ඡේද දෙකක් හා 10 - 11 ශ්‍රේණි සඳහා සතියකට කාල පරිච්ඡේද තුනක් වෙන් කර ඇත.

අ.පො.ස සා.පෙළ) විභාගයට 10 - 11 ශ්‍රේණි සඳහා නියමිත විෂය නිර්දේශ පදනම් කරගෙන ඇගයීම සිදු කිරීමට යෝජිත ය.

6 - 11 ශ්‍රේණි සඳහා නිපුණතා පාදක ප්‍රවේශයට ප්‍රධාන නිපුණතා විසිතුනක් යටතේ ඉතිහාසය විෂයමාලාව ගොඩනගා ඇත. එම විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට සකසා ඇති මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශය හා විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මඟපෙන්වීම යන කොටස් දෙකකින් සමන්විත ය.

ඉතිහාසය විෂයය මඟින් ශිෂ්‍යයන් තුළ ප්‍රගුණ කිරීමට අපේක්ෂිත නිපුණතා සංවර්ධනය කිරීමේ දී විෂය කරුණු මෙන් ම විෂය කරුණු අධ්‍යයනය කිරීමට යොදාගන්නා ක්‍රමවේද ද වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගුරු කාර්ය පහසු කර ගැනීම සඳහා විෂය අන්තර්ගතයෙහි ඇතැම් කොටස් ආවරණය වන පරිදි නිදර්ශක ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් කර ඇත. ඔබගේ නිර්මාණශීලී හැකියා ප්‍රයෝජනයට ගනිමින් පන්ති කාමර අවශ්‍යතා අනුව මෙම ක්‍රියාකාරකම් තව දුරටත් සංවර්ධනය කිරීම හා නව ක්‍රියාකාරකම් සැකසීමට හැකි ය. මෙහි දී සැලකිලිමත් විය යුත්තේ ඉතිහාසය විෂ යේ අරමුණු ඉටු වන පරිදි අවම වශයෙන් 50% ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරමින් නියමිත විෂය කරුණු අධ්‍යයනයට ශිෂ්‍යයන් යොමු කිරීම යි.

ඒ අනුව ඉතිහාසය විෂයයේ අරමුණු ඉටු කරමින් නිපුණතා සපිරි නව ලොවකට උචිත සිසු පිරිසක් බිහි කිරීමට අත්වැලක් සැපයීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් ඔබගේ සංවර්ධනාත්මක අදහස් හා යෝජනා අප වෙත යොමු කරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

**විෂයමාලා කමිටුව**

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vi |
| විෂය නිර්දේශය අන්තර්ගතය | viii-xx |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01 - 32 |
| 8.1 ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්‍ෂණය සහ කලාව | 01 - 08 |
| 8.2 මහනුවර රාජධානිය | 09 - 18 |
| 8.3 යුරෝපයේ පුනරුදය | 19 - 23 |
| 8.4 දේශ ගවේෂණය හා යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම | 24 - 26 |
| 8.5 ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසින් යටතට පත්වීම | 27 - 32 |

# ඉතිහාසය

## විෂය නිර්දේශය

## 8 ශ්‍රේණිය

**(2017 සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

## හැඳින්වීම

තම රටේ අනන්‍යතා හඳුනා ගනිමින් , ඒවා රැකගනිමින් ලෝක තත්ත්වවලට මුහුණ දිය හැකි දැ හිතකාමී, ශක්තිමත් ශ්‍රී ලාංකික පුරවැසියකු බිහිකර ගැනීමේ අරමුණු පෙරදැරි කර ගෙන පාසල් විෂයමාලාවේ හර විෂයයක් ලෙස ඉතිහාසය විෂය 2007 වසරේ සිට ක්‍රියාත්මක වේ.

මෙම අරමුණු වඩාත් පෝෂණය කරමින් 2015 වසරේ දී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ජාතික පොදු අරමුණු සහ ජාතික පොදු නිපුණතා ද පාදක කර ගනිමින් ඉතිහාසය විෂයයට අදාළ ව නිපුණතා විසිතුනක් යටතේ 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් නිපුණතා පාදක ක්‍රමවේදයක් මත ඉතිහාසය විෂයමාලාව සකස් කර ඇත.

8 ශ්‍රේණිය සඳහා වූ මෙම විෂය නිර්දේශය එහි ප්‍රතිඵලයකි. 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වීමට නියමිත මෙහි නිපුණතා පහක් යටතේ විෂය අන්තර්ගතය ගොඩනගා තිබේ. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කලාව හා තාක්ෂණය, මහනුවර රාජධානිය, යුරෝපයේ පුනරුදය, දේශ ගවේෂණය සහ යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම, ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසින් යටතට පත්වීම ඇතුළත් තේමා හයක් අධ්‍යයනය සඳහා ඉදිරිපත් කර ඇත.

.

| වාරය | ඒකක |
|---|---|
| i වාරය | 1 |
| ii වාරය | 2 , 3 |
| iii වාරය | 4 , 5 |

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම් ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මඟින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහ හා ක්‍රියාවලිවල දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය මඟින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගනු ලැබ ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගනු ලැබ ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

I වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

x III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුම්වත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීමට ද පවත්වා ගෙන යාමට ද සහාය වීම

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත්වලට සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවාන්විත ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කර ගැනීමට දායක වනු ඇත.

### (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම



තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දි ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

### (II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්ති, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටිමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයෝ
- චිත්තවේගී බුද්ධිය

### (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය :	සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය :	අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිශ්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව
ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ළැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපාය ක නිරත වීම
ඍ: යන හැකියාවන් උපරිම කිරීමට හා ශක්‍යතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන් තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්මවලට, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ඒවා ස්වීයකරණය කරගැනීම

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් මඟින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## ඉතිහාසය විෂයයේ අරමුණු

6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය තෙක් වූ විෂයමාලාව අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කර ගනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

1. ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම
2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය මගින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමය සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම
4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම
5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
6. කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට  භාවිත කිරීම
7. වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම
8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති  කර ගැනීම
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| පැරණි තාක්ෂණික සහ කලාත්මක නිර්මාණ අගයමින් එම දායාද සුරකියි | 1.1 පැරණි ජල තාක්ෂණයෙහි විශිෂ්ටත්වය පෙන්වා දෙයි | 1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව<br>1.1 පැරණි ජල තාක්ෂණය | • පැරණි වැව් සහ අමුණු පිළිබඳ ව විස්තර කරයි<br>• වාරි කර්මාන්තය හා බැඳි තාක්ෂණය පහදයි<br>• වාරි කර්මාන්තය පිළිබඳ ව මුතුමිත්තන් දැක්වූ දක්ෂතා අගය කරයි | 14 |
| | 1.2 පැරණි ලෝහ සහ මැටි තාක්ෂණය පැහැදිලි කරයි | 1.2 අතීත මැටි සහ ලෝහ තාක්ෂණය | • පැරණි ලෝහ සහ මැටි කර්මාන්තය පිළිබඳ ව විස්තර කරයි<br>• පැරණි ලෝහ සහ මැටි කර්මාන්ත සඳහා භාවිත කළ තාක්ෂණය පහදයි<br>• අතීත ලාංකිකයන්ගේ ලෝහ සහ මැටි තාක්ෂණය පිළිබඳ දැනුම අගය කරයි | |
| | 1.3 හෙළ කලාකරුවන්ගේ නිර්මාණශීලිත්වය විස්තර කරයි | 1.3 වාස්තු විද්‍යාත්මක සහ කලා නිර්මාණ | • වාස්තු විද්‍යාත්මක සහ කලා නිර්මාණ නම් කරයි<br>• වාස්තු විද්‍යාත්මක සහ කලා නිර්මාණවල විශිෂ්ටත්වය පෙන්වා දෙයි<br>• වාස්තු විද්‍යාත්මක සහ කලා නිර්මාණවල විශිෂ්ටත්වය අගය කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලාංකික රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය අගයමින් දේශීය උරුමය රැක ගැනීමට පෙලඹෙයි | 2.1 මහනුවර රාජධානියේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට පාලකයන් ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරයි | 2. මහනුවර රාජධානිය<br>• ආරම්භය<br>• කැපී පෙනෙන රජවරු | • මහනුවර රාජධානියේ ආරම්භය පැහැදිලි කරයි<br>• මහනුවර රාජධානියේ රජවරුන්ගේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග විමර්ශනය කරයි<br>• මහනුවර රාජධානියේ ස්වාධීනත්වය රැකගත් ආකාරය පහදයි<br>• මහනුවර අවදියේ යැපීම් ක්‍රම විස්තර කරයි | 12 |
| | 2.2 මහනුවර රාජධානියේ ආර්ථික හා සංස්කෘතික තොරතුරු ඇසුරෙන් දේශීයත්වය මතු කර දක්වයි | • ආර්ථික රටාව<br>• ආගම සහ සමාජය<br>• වාස්තු විද්‍යාව හා ශිල්ප කලා | • මහනුවර අවධියේ පැවති ආගමික තත්ත්වය විමර්ශනය කරයි<br>• මහනුවර අවදියේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ හා ශිල්ප කලා පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ඓතිහාසික ගෝලීය ප්‍රවණතාවලින් ශ්‍රී ලංකාව ආභාසය ලබා ඇති ආකාරය විමසා බලා තම උරුමය හා අනන්‍යතාව රැකගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගනියි | 3.1 යුරෝපයේ ගමන් මඟ වෙනස් කිරීමට පුනරුදය බලපෑ ආකාරය විග්‍රහ කරයි | 3. යුරෝපයේ පුනරුදය<br>• පුනරුදයේ පසුබිම<br>– හැඳින්වීම<br>– පුනරුදයට හේතු<br>• පුනරුදය ඇති වීම<br>– බුද්ධි ප්‍රබෝධය (ශාස්ත්‍රීය ප්‍රබෝධය)<br>– ජාතික රාජ්‍ය බිහි වීම<br>• වෙළෙඳාමේ දියුණුව<br>• නව විද්‍යාත්මක සොයා ගැනීම්<br>• ආගමික ප්‍රතිසංස්කරණ | • පුනරුදය යන්න පැහැදිලි කරයි<br>• පුනරුදය ඇති වූ පසුබිම පැහැදිලි කරයි<br>• ශාස්ත්‍රීය නවෝදය උදාහරණ සහිත ව විස්තර කරයි<br>• නව රාජාණ්ඩු ක්‍රමයේ බිහි වීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි<br>• නව වෙළෙඳ රටාවක් බිහි වන ආකාරය පැහැදිලි කරයි<br>• නව විද්‍යාත්මක සොයා ගැනීම් උදාහරණ සහිත ව පෙන්වා දෙයි<br>• ආගමික වෙනස් වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ඓතිහාසික ගෝලීය ප්‍රවණතාවලින් ශ්‍රී ලංකාව ආභාසය ලබා ඇති ආකාරය විමසා බලා තම උරුමය හා අනන්‍යතාව රැකගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගනියි | 4.1 යුරෝපයේ ඇති වූ දේශ ගවේෂණ ව්‍යාපාරය විග්‍රහ කරයි | 4. **දේශ ගවේෂණය හා යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම**<br>• දේශ ගවේෂණ කටයුතුවල පසුබිම<br>• දේශ ගවේෂණයට සම්බන්ධ පුද්ගලයෝ හා රටවල්<br>• යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම | • දේශ ගවේෂණ ව්‍යාපාරය පැහැදිලි කරයි<br>• දේශ ගවේෂණ ව්‍යාපාරයට හේතු දක්වයි<br>• දේශ ගවේෂණයට සම්බන්ධ පුද්ගලයන් සහ රටවල් නම් කරයි<br>• වෙළෙඳ මාර්ග ඔස්සේ නව රටවල් සොයාගත් ආකාරය පෙන්වා දෙයි<br>• යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි<br>• දේශ ගවේෂණ ව්‍යාපාරය දැක්වෙන ප්‍රධාන මාර්ග, රටවල් සහ ස්ථාන සිතියමක ලකුණු කර නම් කරයි | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| රටක විදේශ ආධිපත්‍යය ගොඩනැගීම සඳහා බලපාන සාධක බටහිර ජාතීන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම ඇසුරින් විමර්ශනය කරයි | 5.1 පෘතුගීසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල බලය පිහිටුවා ගත් ආකාරය පැහැදිලි කරයි | **5.ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසීන් යටතට පත් වීම**<br>• පෘතුගීසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල බලය පිහිටුවා ගැනීම<br>– පෘතුගීසීන් ශ්‍රී ලංකාවට අවධානය යොමු කිරීම<br>– පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට මෙරට දේශපාලන තත්ත්වය<br>– පෘතුගීසීන් කෝට්ටේ, සීතාවක හා යාපනය රාජධානි සමඟ පැවැත් වු සම්බන්ධතා<br>– පෘතුගීසීන් උඩරට සමඟ පැවැත් වු සම්බන්ධතා | • පෘතුගීසීන් ශ්‍රී ලංකාවට අවධානය යොමු කිරීමට හේතු දක්වයි<br>• පෘතුගීසීන් පැමිණෙන විට මෙරට දේශපාලන තත්ත්වය විස්තර කරයි<br>• පෘතුගීසීන් මුහුදුබඩ පළාත්වල බලය පිහිටුවා ගැනීමේ අවස්ථා පැහැදිලි කරයි | 10 |
| ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජ ව්‍යුහයට අනුකලනය වූ ආකාරය විග්‍රහ කරයි | 5.2 පෘතුගීසීන්ගේ පාලනය, ආර්ථික, සහ සංස්කෘතික කටයුතු මෙරට ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය විග්‍රහ කරයි | • පෘතුගීසීන්ගේ දේශපාලන, ආර්ථික, සමාජ සහ සංස්කෘතික කටයුතු | • ශ්‍රී ලංකාව තුළ පෘතුගීසී පාලනයේ ස්වභාවය පෙන්වා දෙයි<br>• පෘතුගීසීන් යටතේ ආර්ථික කටයුතු විස්තර කරයි<br>• පෘතුගීසී පාලනයෙන් මෙරට සංස්කෘතියට එක් වූ නවාංග පෙන්වා දෙයි | |

**(ඇ) පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්**

ඉතිහාසය විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු සාර්ථක ව හා ඵලදායී ලෙස අධ්‍යයනය කිරීම සඳහාත් එ මඟින් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහාත් ශිෂ්‍ය සහභාගිත්වය වර්ධනය වන ආකාරයට පාසල් වැඩ සටහන් සම්පාදනය කර ගැනීම ඒවා අතිශයින් ම ප්‍රයෝජනවත් විය යුතුය.

මෙහි යෝජනා කොට ඇත්තේ එවැනි පාසල් වැඩ සටහන් කිහිපයක් පමණි. මේ අනුව වෙනත් නිර්මාණාත්මක වැඩ සටහන් හා ප්‍රතිපත්ති සකස් කර ගැනීමේ නිදහස ඉතිහාසය උගන්වන ගුරුවරයාට හිමි වන බව සලකන්න.

- ඉතිහාස සංගමයක් පිහිටුවීමෙන් සිසු දැනුම ප්‍රවර්ධනය සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, විවාද, ප්‍රදර්ශන පැවැත්වීමත්, සඟරා, බිත්ති පුවත්පත් නිර්මාණය කිරීමත් වැනි කාර්යයන්ට සිසුන් යොමු කළ හැකිය.

- යටත් පිරිසෙන් වසරකට වරක් වත් වැදගත්කමකින් යුතු ස්ථානයකට හෝ ප්‍රදේශයකට හෝ අධ්‍යාපන චාරිකා සංවිධානය කළ යුතු ය. පන්ති කාමරයේ දී ලබා ගත් දැනුම තහවුරු කර ගැනීමට හා වර්ධනය කර ගැනීමට හැකි වන පරිදි පෙර සැලසුමකින් යුතු ව අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම වැදගත් වේ.

- දිවයිනේ පිළිගත් ඉතිහාසඥයන් පාසලට කැඳවා ඔවුන්ගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට සම්මන්ත්‍රණ මඟින් අවස්ථා ව සැලසිය හැකි ය.

- ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්මාරක පිළිබඳ ව සොයා බැලීම හා ඒවා ආරක්ෂා කිරීම සඳහා පාසල් හා ප්‍රජා  වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පුළුවන.

- ඉතිහාස පාඩම්වලට අදාළ වන චිත්‍ර, මූර්ති, කැටයම් හා වෙනත් කෞතුක වස්තු නිරීක්ෂණය කිරීමටත්, නිරීක්ෂණ වාර්තා සැපයීමටත් හැකි වන පරිදි කෞතුකාගාර වැඩසටහන් සංවිධානය තළ හැකිය.

- ඉතිහාස පාඩමට අදාළ ව අන්තර්ජාලය භාවිත කරමින් තොරතුරු ලබා ගැනීම සඳහා සිසුන් යොමු කළ යුතු ය.

### (ඇ) ඇගයීම සහ තක්සේරුකරණය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මඟින් අපේක්ෂිත ඵල සිසුන් විසින් සාත්ෂාත් කර ගනු ලැබීම සහ තහවුරු කිරීම සඳහාත් සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩ සටහන් දෙකක් ලෙස තක්සේරුව සහ ඇගයීම හඳුන්වා දිය හැකි ය.තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සිසුන්ට අපේක්ෂිත නිපුණතාවලට අදාළ ආසන්න ප්‍රවීණතා ලබා ගැනීම අපහසු නොවේ. ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමය.

තක්සේරුවෙහි යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙආකාරයකින් මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය.එ නම් ප්‍රතිපෝෂණ (Feed Back) ඉදිරි පෝෂණ (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ ප්‍රබලතා සහ දුබලතා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්ය භාරය වේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා විෂය නිපුණතා අතුරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කරගත හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගනු ලැබීම අවශ්‍ය වේ.ඇගයීම් වැඩපිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රිය නිපුණතා පාදක ක්‍රියාකාරකම් දිශාභිමුඛ කරගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ක්‍රියාවෙන් ඉගෙනුම සඳහා සිසුන් යොමු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.සිසුන් ක්‍රියාකාරකම්වල නියැළෙන විට හා එය අවසානයේ දී තක්සේරුව හා ඇගයීම සිදු කළ හැකි වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි ඒ සඳහා පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ.මේ අතුරෙන් පළමු නිර්ණායක තුන නිපුණතාව ගොඩනැඟීමට ඒකරාශි වී තිබෙන දැනුම,කුසලතා සහ ආකල්ප මූලික කොටගෙන සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා වර්ධනයට උපකාරී වන අයුරින් සැකසිය යුතු ය. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පන්ති කාමරය තුළ දී සිසුන් ක්‍රියාත්මක වීමේදී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු තක්සේරුව යටතේ එම චර්යා ශක්තිමත් කිරීමටත් ඇගයීම යටතේ ඒවා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු ය. මීට අමතරව පන්ති කාමරය තුළ ලිඛිත පරීක්ෂණ, ව්‍යාපෘති ආදියටත් මාසික. වාර සහ වසර අවසානයේ පවත්වනු ලබන පාසල් මට්ටමේ හෝ කලාපීය මට්ටමේ හෝ ලිඛිත පරීක්ෂණවලටත් සිසුන් ඉදිරිපත් කළ හැකි ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 8.1 ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දේශීය තාක්ෂණය හා කලාව

ඉපැරැණි ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාව විශිෂ්ට කලාත්මක හා තාක්ෂණික නිර්මාණ රැසක් දායාද කොටගෙන ඇති දේශයකි. රටේ අනන්‍යතාව පෙන්වන මෙබඳු නිර්මාණ පිළිබඳ ව අපි අවබෝධයක් ලබා ගත යුතු වෙමු. එම අරමුණු ඉටු කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ දේශීය තාක්ෂණය හා කලාත්මක නිර්මාණ අතුරින් කිහිපයක් වන පැරණි ජල තාක්ෂණය, අතීත ලෝහ තාක්ෂණය, වාස්තු විද්‍යාත්මක නිර්මාණ සහ විවිධ කලා නිර්මාණ කෙරෙහි ඔබගේ අවධානය යොමු කර ඇත.

**නිපුණතාව** : පැරණි තාක්ෂණික හා කලාත්මක නිර්මාණ අගයමින් එම දායාද සුරකියි

**නිපුණතා මට්ටම** : 1.1.පැරණි ජල තාක්ෂණයෙහි විශිෂ්ටත්වය පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 06 යි**

**ඉගෙනුම් පල**

- පැරණි වැව් සහ අමුණු පිළිබඳ විස්තර කරයි
- පැරණි වාරි කර්මාන්තය හා බැඳි තාක්ෂණය පහදයි
- වාරි කර්මාන්තය පිළිබඳ ව අපේ මුතුමිත්තන් දැක්වූ දක්ෂතා අගය කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරගන්න

**1.1 ජල තාක්ෂණය**

මෙය කොටස් කිහිපයකි

- වැව් තාක්ෂණය
- ඇළ සහ වේලි තාක්ෂණය
- පොකුණු තාක්ෂණය
- ජල උද්‍යාන


- වැව් තාක්ෂණය
  - වැව් ඉදි කිරීමේ ආරම්භය
  - මහා වැව් තෙක් වර්ධනය
  - වැව් තැනීමේ දී මුහුණ දුන් අභියෝග
  - වැව හා බැඳුණු තාක්ෂණය
    - * භූමිය තෝරා ගැනීම
    - * වැව නිර්මාණය
    - * වැවක ප්‍රධාන අංග

- ඇළ සහ වේලි තාක්ෂණය
  - ඇළ මාර්ග තැනීමේ අවශ්‍යතාව
  - ඇළ මාර්ග තැනීමේ දී මුහුණ දුන් අභියෝග
  - ඇළ මාර්ග හා බැඳුණු තාක්ෂණය

වැව් ඉදිකිරීම සඳහා භූමිය තෝරා ගැනීම



ඇළවලට පැති බැම් යෙදීම



- පොකුණු තාක්ෂණය
    - පොකුණු තැනීමේ අවශ්‍යතාව
    - පොකුණු වර්ග
    - පොකුණු හා බැඳුණු තාක්ෂණය

- ජල උද්‍යාන
    - ජල උද්‍යාන සැලසුම් කිරීම
    - ජල උද්‍යානවල කැපී පෙනෙන අංග
    - ජල උද්‍යාන හා බැඳුණු තාක්ෂණය

**ක්‍රියාකාරකම 01**

**වැව් ඉදිකිරීම හා වාරි තාක්ෂණයට අදාළ විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් යොමු කරවන්න.**

- පන්තියේ සියලු දෙනාගේ ම සහභාගිත්වයෙන් වැවක ආකෘතියක් නිර්මාණය කරවන්න.
- වැව් බැම්ම, සලපනාව(රළපනාව), බිසෝ කොටුව, පිටවාන, ඇතුළුවාන, ඇළ මාර්ග ආදි වැවේ ප්‍රධාන අංග ඊට ඇතුළත් කරන්න.
- වැවක තාක්ෂණික අංග පිළිබඳ ව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරමින් පාඩම සමාලෝචනය කරන්න.
- ක්‍රියාකාරකම සඳහා සුදුසු පරිදි කාලය වෙන් කර ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න
- වැවක ප්‍රධාන අංග නම් කරයි
- වාරි තාක්ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- වැවක නිවැරදි ආකෘතියක් ගොඩනගයි
- පැරණි වාරි තාක්ෂණය අගය කරයි
- වැවෙහි ආකෘතිය ගොඩනැඟීමට දායක වෙයි

**ගුණාත්මක යෙදවුම්**

වැවක ආකෘතිය ගොඩනැඟීම සඳහා අවශ්‍ය මැටි, ගල්පතුරු ආදි ද්‍රව්‍ය

**ක්‍රියාකාරකම 02**

**පොකුණු හා ජල උද්‍යාන පිළිබඳ විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි සිසුන් යොමු කරවන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදාගන්න
- පන්තියේ ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කර අංක 1 කාර්ය පත්‍රිකාව බෙදා දෙන්න
- ක්‍රියාකාරකම වඩාත් නිර්මාණශීලී ව සැකසීමට උපදෙස් දෙන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න
- සිසු ක්‍රියාකාරකම් පන්තියේ ප්‍රදර්ශනය කරන්න
- සිසු දක්ෂතා, දුබලතා පෙන්වා දෙමින් විෂය කරුණු ආවරණය වන සේ පාඩම සමාලෝචනය කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

- ශ්‍රී ලංකාවේ පැරණි පොකුණු හා ජල උද්‍යාන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පැරණි පොකුණු හා ජල උද්‍යාන පිළිබඳ තොරතුරු එකතුවක් සකසයි.
- පැරණි පොකුණු හා ජල තාක්ෂණය පිළිබඳ අගය කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා දායක වෙයි.
- මූලිකත්වය ගෙන කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- අංක 1 කාර්ය පත්‍රිකාව
- බ්‍රිස්ටල් බෝඩ්
- පැරණි පොකුණු හා ජල උද්‍යාන පිළිබඳ තොරතුරු හා පින්තූර
- ගම්, කතුරු, ප්ලැටිග්නම් පෑන්

**අංක 1 කාර්ය පත්‍රිකාව**

- පැරණි පොකුණු හා ජල උද්‍යාන පිළිබඳ තොරතුරු හා පින්තූර රැස් කරන්න.
- ඒ සඳහා කණ්ඩායමේ සියලු දෙනාගේ සහය ලබා ගන්න
- ගුරුතුමිය විසින් දනුම් දෙන දිනයක දී අදාළ තොරතුරු වඩා නිර්මාණශීලී ව පන්තියේ ප්‍රදර්ශනයට සුදුසු පරිදි බ්‍රිස්ටල් බෝඩ් එකක අලවන්න
- ක්‍රියාකාරකම පන්තියේ ප්‍රදර්ශනය කර එහි තොරතුරු පන්තිය වෙත ඉදිරිපත් කරන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න
- කණ්ඩායමේ සියල්ලන් ම ක්‍රියාකාරකම සඳහා සහභාගි කරගන්න

**නිපුණතා මට්ටම :** 1.2 පැරණි මැටි හා ලෝහ තාක්ෂණය පැහැදිලි කරයි

**කාල්ච්ඡේද සංඛ්‍යාව: 05 යි**

**ඉගෙනුම් පල**

- පැරණි මැටි හා ලෝහ කර්මාන්ත පිළිබඳ ව විස්තර කරයි
- මැටි සහ ලෝහ කර්මාන්ත සඳහා භාවිත කළ තාක්ෂණය පහදයි
- පැරණි මුතුමිත්තන් සතු ලෝහ සහ මැටි කර්මාන්ත සඳහා වූ දැනුම අගය කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරගන්න

**1.2 අතීත මැටි තාක්‍ෂණය සහ ලෝහ තාක්ෂණය**

- මැටි නිර්මාණ හා තාක්ෂණය
  - මැටි භාජන සැකසීම
    - සකපෝරුව භාවිත කිරීම
    - උසස් තත්ත්වයේ භාජන
    - උළු හා ගඩොල් කර්මාන්තය
      - * උළු හා ගඩොල් සැකසීම
      - * වර්ණ ගැන්වීම
      - * වෙනත් මැටි නිර්මාණ

- ලෝහ තාක්ෂණය
  - භාවිත කරන ලද ලෝහ වර්ග
    - * යකඩ
    - * ලෝකඩ
    - * රිදී
    - * රන්
  - ලෝහ නිස්සාරණය කිරීම සිදු කළ ආකාරය
  - ලෝහ භාවිත කළ බවට හමු වී ඇති සාධක

**ක්‍රියාකාරකම**

ඉහත විෂය කරුණු ආවරණය වන සේ "අපේ අතීත මුතුමිත්තන් " මැටි සහ ලෝහ භාවිත කරමින් සකසන ලද උසස් නිර්මාණ පිළිබඳ ව විදේශ රටක සිටින මිතුරකුට/මිතුරියකට ලිපියක් ලිවීම

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ක්‍රියාකාරකම පන්ති කාමරය තුළ දී සිදු කරන්න
- අහඹු ලෙස තෝරාගත් ලිපි කිහිපයක් පන්තියට ඉදිරිපත් කරවන්න
- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්වල දුර්වලතා ශක්‍යතා පෙන්වා දෙමින් පාඩම සමාලෝචනය කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- මැටියෙන් සහ ලෝහවලින් සැකසූ පැරණි නිර්මාණ නම් කරයි
- මැටි සහ ලෝහ නිර්මාණවල විශිෂ්ටත්වය විස්තර කරයි
- මැටි සහ ලෝහ නිර්මාණවල විශිෂ්ටත්වය අගය කරයි
- තොරතුරු නිවැරදි ව දක්වයි
- තොරතුරු පන්තියට ඉදිරිපත් කරයි

**නිපුණතා මට්ටම**

1.3 හෙළ කලාකරුවාගේ නිර්මාණශීලිත්වය විස්තර කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 05 යි**

**ඉගෙනුම් පල**

- වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණ නම් කරයි
- වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණවල විශිෂ්ටත්වය පැහැදිලි කරයි
- වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණවල විශිෂ්ටත්වය අගය කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරගන්න

**1.3 වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණ**

රජරට අවදියට අයත් වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණ පිළිබඳ ව මෙහි දී සාකච්ඡා කෙරේ

- වාස්තු විද්‍යාත්මක නිර්මාණ
  - ගෘහ නිර්මාණ
    - ආගමික ගොඩනැගිලි
      - බෝධිඝර, චෛතියඝර, පඨිමාඝර, විහාර ආරාම, භාවනා කුටි, දානශාලා
      - දේවාල
    - ආගමික නොවන ගොඩනැගිලි
      - රජ මාලිගා, බලකොටු
      - ආරෝග්‍යශාලා, නිවාස, වැසිකිළි-කැසිකිළි,

- කලා නිර්මාණ
  - ප්‍රතිමා
  - කැටයම් හා මූර්ති
  - චිත්‍ර

**ක්‍රියාකාරකම**

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ ප්‍රදර්ශනයක් පැවැත්වීමට ශිෂ්‍යයන් යොමු කරන්න**

- ශ්‍රී ලංකාවේ පැරණි වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණ පිළිබඳ ව ශිෂ්‍යයන් සමඟ සකච්ඡා කරන්න
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා 2 කණ්ඩායම්වලට බෙදා දෙන්න
- කාර්ය පත්‍රිකා ප්‍රමාණයට වඩා කණ්ඩායම් වැඩි නම් එක ම කාර්ය පත්‍රිකා කණ්ඩායම් කිහිපයකට ලබා දෙන්න
- කාර්ය පත්‍රිකාවෙහි සඳහන් පරිදි ශිෂ්‍යයන් ක්‍රියාකාරකම සඳහා යොමු කරවන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න
- ක්‍රියාකාරකම සඳහා තොරතුරු හා පින්තූර සූදානම් කරගත් පසු පන්ති කාමරය තුළ එක් කාලපරිච්ඡේදයක දී බ්‍රිස්ටල් බෝඩ්වල සැකසීමට අවස්ථාව දෙන්න
- ප්‍රදර්ශනය පැවැත්වූ පසු ශිෂ්‍ය දක්ෂතා දුබලතා පෙන්වා දෙමින් පාඩම සමාලෝචනය කරන්න
- ප්‍රදර්ශනය පැවැත්වෙන දිනයේ දී පාසලේ සෙසු අය සඳහා විදුහල්පතිගේ අනුමතිය ඇති ව එය නැරඹීමට ආරාධනය කරන්න.(ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සඳහා බාධා නොවන අයුරින්)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න

- වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණ නම් කරයි
- වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණවල විශිෂ්ටත්වය පෙන්වා දෙයි
- වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණ අගය කරයි
- තොරතුරු වඩා නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි
- ක්‍රියාකාරකම සාර්ථක කර ගැනීමට දායක වෙයි

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1 - කාර්ය පත්‍රිකා
- ඇමුණුම 2 - පොදු උපදෙස් පත්‍රිකාව
- බ්‍රිස්ටල් බෝඩ්
- පැරණි වාස්තුවිද්‍යාව හා කලා නිර්මාණ පිළිබඳ ව ලියවී ඇති පොත්පත් හා පින්තූර
- ප්‍රදර්ශනය සඳහා තොරතුරු හා පින්තූර සැකසීමට අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය හා උපකරණ

**ඇමුණුම 1**

| |
|---|
| කාර්ය පත්‍රිකා 1<br>1 කණ්ඩායම සඳහා<br>• අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත්, දාගැබ්, බෝධිඝර, පඩිමාඝර, විහාර ආරාම, භාවනා කුටි, දාන ශාලා සහ දේවාලය පිළිබඳ තොරතුරු හා පින්තූර එක්රැස් කිරීම ඔබ කණ්ඩායමට පැවරේ.<br>• ඇමුණුම 2හි පොදු උපදෙස් පත්‍රිකාව සහ ගුරු උපදෙස් පිළිපදිමින් ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා සූදානම් වන්න. |
| කාර්ය පත්‍රිකා 2<br>2 කණ්ඩායම සඳහා<br>• අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත්, රජ මාලිගා, බලකොටු, ආරෝග්‍යශාලා, වැසිකිළි-කැසිකිළි, නාන පොකුණු පිළිබඳ තොරතුරු හා පින්තූර එක්රැස් කිරීම ඔබ කණ්ඩායමට පැවරේ.<br>• ඇමුණුම 2හි පොදු උපදෙස් පත්‍රිකාව සහ ගුරු උපදෙස් පිළිපදිමින් ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා සූදානම් වන්න. |
| කාර්ය පත්‍රිකා 3<br>3 කණ්ඩායම සඳහා<br>• අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත්, ප්‍රතිමා, කැටයම් හා මූර්ති, චිත්‍ර පිළිබඳ තොරතුරු හා පින්තූර එක්රැස් කිරීම ඔබ කණ්ඩායමට පැවරේ.<br>• ඇමුණුම 2හි පොදු උපදෙස් පත්‍රිකාව සහ ගුරු උපදෙස් පිළිපදිමින් ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා සූදානම් වන්න. |

**ඇමුණුම 2**

**පොදු උපදෙස් පත්‍රිකාව**

- ඔබ කණ්ඩායමට ලැබී ඇති මාතෘකාවලට අදාළ ව තොරතුරු හා පින්තූර එක්රැස් කරන්න
- එම තොරතුරු හා පින්තූර ගුරුතුමා/ගුරුතුමිය දැනුම් දෙන දිනයක දී පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සුදුසු ලෙස බ්‍රිස්ටල් බෝඩ්වල සකස් කරන්න
- වඩා නිර්මාණශීලී ව තොරතුරු සැකසීමට කණ්ඩායමේ සියලු දෙනා සහයෝගය ලබා දෙන්න
- ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා සහයෝගය ලබා දෙන්න

## 8.2 මහනුවර රාජධානිය

පසළොස් වන සියවස අග භාගයේ දී ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ සෙංකඩගල නගරය කේන්ද්‍ර කොට ගෙන බිහි වූ රාජධානිය මහනුවර රාජධානිය ලෙස හැඳින්වේ. කෝට්ටේ රාජධානි සමයේ දී සාමන්ත පාලකයකු යටතේ පැවති උඩරට ප්‍රදේශ ආශ්‍රිත ව මුල් වරට ස්වාධීන රාජ්‍යයක් බිහි කළේ සේනා සම්මත වික්‍රමබාහු රජු යැයි පිළිගැනේ. සේනාසම්මත වික්‍රමබාහු රජුට පසු ව ඔහුගේ පරපුරට අයත් ජයවීර බණ්ඩාර සහ කරලියැද්දේ බණ්ඩාර යන රජවරුන් විසින් උඩරට රාජ්‍යය පාලනය කරන ලදී.

අනතුරුව සීතාවක රාජසිංහ රජු (පළමු වෙනි රාජසිංහ) උඩරට රාජධානිය සීතාවකට යටත් කළ නමුදු පළමු වන විමලධර්මසූරිය රජු සීතාවක ආධිපත්‍යයෙන් සහ පෘතුගීසි බලපෑම්වලින් උඩරට නිදහස් කර එය ශක්තිමත් රාජ්‍යයක් බවට පත් කළේ ය. විමලධර්මසූරිය රජුගෙන් ඇරඹි පරපුර වර්ෂ 1739 තෙක් උඩරට රජ කළ අතර එතැන් සිට නායක්කාර් පෙළපතේ රජවරු සිවු දෙනෙක් උඩරට පාලනය කළහ. එම රජ පරපුරේ අවසන් පාලකයා වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු වර්ෂ 1815 දී බ්‍රිතාන්‍යයන්ගේ අත්අඩංගුවට පත් වීමත් සමඟ උඩරට රාජධානි සමය අවසන් විය.

සේනාසම්මත වික්‍රමබාහු රජුගේ සිට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු තෙක් මහනුවර රාජ්‍ය පාලනය කළ රජවරුන් හා ඔවුන් මුහුණ දුන් අභියෝග පිළිබඳ ව ද නායක්කාර් පරපුර බලයට පත් වීම පිළිබඳ ව ද තොරතුරු මෙම ඒකකයේ දැක්වේ. රණශූර රජවරුන් ගේ උපක්‍රමශීලී පාලනයත් ජනතාව ගේ රාජපාක්ෂික භාවය හා එකමුතුකමත් රාජධානියේ ස්වාධීන පැවැත්මට හා ව්‍යාප්තියට හේතු වූ බවත් එකමුතුකම බිඳවැටුණු සෑම විට ම විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු වූ බවත් අධ්‍යයනය කළ හැකි ය. මීට අමතර ව මහනුවර රාජධානියේ පැවති ස්වයංපෝෂිත ආර්ථික රටාවේ ස්වභාවය, වාස්තු විද්‍යාව හා කලාශිල්ප ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ උඩරට සමාජ ක්‍රමය හා ආගමික ඇදහිලි විශ්වාස පිළිබඳ ව අවධානය යොමු කර ඇත.

**නිපුණතාව** : ශ්‍රී ලාංකික රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය අගයමින් ජාතික උරුමය රැක ගැනීමට පෙළඹෙයි

**නිපුණතා මට්ටම** : 1.1 මහනුවර රාජධානියේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට පාලකයන් ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරයි

**කාලච්ඡේද** : **06 යි**

**ඉගෙනුම් පල** :

- මහනුවර රාජධානියේ ආරම්භය පැහැදිලි කරයි
- මහනුවර රාජධානියේ රජවරුන්ගේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග විමර්ශනය කරයි
- මහනුවර රාජධානියේ ස්වාධීනත්වය රැකගත් ආකාරය පහදයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.

### 8.1.1 උඩරට රාජ්‍යයේ ආරම්භය හා කැපී පෙනෙන රජවරු

- උඩරට රාජධානියේ ස්වාභාවික පිහිටීම
- උඩරට කෝට්ටේ රාජ්‍යයට යටත් ප්‍රදේශයක් වශයෙන් පැවතීම
- සේනාසම්මත වික්‍රමබාහු රජු යටතේ ස්වාධීන රාජ්‍යයක් බිහි වීම
- ජයවීර බණ්ඩාර හා කරලියද්දේ බණ්ඩාර යන රජවරු
- සීතාවක රාජසිංහ රජු උඩරට රාජ්‍යය යටත් කර ගැනීම
- පෘතුගීසීන් උඩරට ආක්‍රමණය කිරීම
- කොනප්පු බණ්ඩාර පළමුවන විමලධර්මසූරිය නමින් උඩරට රජ වීම

- පළමු වෙනි විමලධර්මසූරිය රජතුමා
    - දන්තුරේ සටන ජය ගැනීම
:   - කුසුමාසන දේවිය විවාහ කර ගැනීම හා රාජ්‍ය උරුමය ලබා ගෙන නව රජ පරපුරක් බිහි කිරීම
    - බලන සටන
    - විමලධර්මසූරිය රජුගෙන් සිදු වූ සේවය

- සෙනරත් රජු
    - බලයට පත් වීම
    - පෘතුගීසින් සමඟ සබඳතා
    - සෙනෙරත් රජුගෙන් ඉටු වූ සේවය

- දෙවෙනි රාජසිංහ රජු
    - රන්දෙණිවෙල සටන
    - ලන්දේසීන් සමඟ ඇති කරගත් සබඳතා
    - ගන්නෝරුව සටන
    - ලන්දේසි සහය ලබා ගැනීම හා පෘතුගීසින් පලවා හැරීම
    - මහනුවර රාජ්‍යයේ බලය ව්‍යාප්ත කිරීම

-- දෙවෙනි විමලධර්මසූරිය සිට ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ තෙක් රජවරු

- නායක්කර් පෙළපතට බලය හිමි වීම
    - ශ්‍රී විජය රාජසිංහ  බලයට පත් වීම
    - කීර්ති ශ්‍රී රාජසිංහ බලයට පත් වීම
    - නායක්කර් රජවරුන් ලන්දේසීන් සමඟ පැවැත්වූ සබඳතා
    - 1766 ලන්දේසින් සහ කීර්ති ශ්‍රී රාජසිංහ රජු අතර ඇති කරගත් ගිවිසුම
    - ලන්දේසින් පලවා හැරීමට ඉංග්‍රීසීන්ගේ සහය පැතීම
    - කීර්ති ශ්‍රී රාජසිංහ රජු බුදු දහමට අනුග්‍රහය දැක්වීම
- රාජාධි රාජසිංහ රජුගේ පාලන කාලය
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
    - රජු බලයට පත් වීම
    - 1803 ඉංග්‍රීසින් උඩරට රාජ්‍යය ආක්‍රමණය කිරීම
    - රදලවරුන් සහ රජු අතර ගැටුම් ඇති වීම
    - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අතඩංගුවට පත්වීම සහ උඩරට රාජ්‍යය යටත් වීම
    - 1815 උඩරට ගිවිසුම

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකමට ශිෂ්‍යයන් යොමු කරන්න**
**ක්‍රියාකාරකම 01**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ගුණාත්මක යෙදවුම්වල සඳහන් අවශ්‍ය ද්‍රව්‍ය ක්‍රියාකාරකම සිදු කෙරෙන දිනයේ දී රැගෙන ඒමට උපදෙස් දෙන්න
- සැම කණ්ඩායමක් ම ඇමුණුම 01හි සඳහන් වාක්‍ය වෙන වෙන ම වර්ණ කඩදාසි තීරුවල ලියන්න
- එම තීරුවලින් දැක්වෙන්නේ මහනුවර රාජධානියේ විවිධ රජවරුන්ගේ කාර්යයන් බවට දැනුම්වත් කරන්න
- ඇමුණුම 02හි ආකාරයට සුදු කඩදාසිවල රජවරුන්ගේ නම් ලියන්න
- රජුන්ගේ කාර්යයන් සඳහන් කඩදාසි  තීරු අදාළ පත්‍රිකාවල අලවන්න
- එම පත්‍රිකා පන්තියේ  ප්‍රදර්ශනය කොට එක් එක් රජවරුන් පිළිබඳ ව විස්තර කරන්න
- නිවැරදි පත්‍රිකා පන්තියේ සැමට පෙනෙන පරිදි අලවා තබන්න

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01හි රජවරුන්ගේ කාර්ය
- ඇමුණුම - 2 තීරු ඇලවීමට ආදර්ශ පත්‍රිකාව
- ලියන ලද කඩදාසි තීරු
- ප්ලැටිග්නම් පෑන්
- ඩිමයි කොළ, A4 සුදු සහ වර්ණ කඩදාසි

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- මහනුවර රාජධානියේ රජවරුන්ගේ කාර්යභාරය විස්තර කරයි
- රජවරුන්ගේ ක්‍රියාකාරකම් අගයයි
- නිවැරදි ව තොරතුරු ගොනු කරයි
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි
- විස්තර කිරීමට ඉදිරිපත් වෙයි

ඇමුණුම 1

- නව රජ පෙළපතක ආරම්භකයා වීම
- 1594 දන්තුරේ සටනින් පේරෝ ලෝපෙස් ද සූසා පරාජය කිරීම
- 1602 බලන සටනින් ජෙරනිමෝ ද අසවේදු පරාජය කිරීම
- මහනුවර දළදා මාලිගාව ඉදි කිරීම
- දෙල්ගමු විහාරයේ සඟවනු ලැබ සිටි දළදා වහන්සේ සෙංකඩගල නුවරට වැඩම කරවා මාලිගාවේ තැන්පත් කිරීම
- ලංකාතිලක විහාරය ආදි වෙහෙර - විහාර ප්‍රතිසංස්කරණය කිරීම
- 1638 දී ගන්නෝරුව සටනට නායකත්වය දී පෘතුගීසීන් සමූල ඝාතනය කිරීම
- උඩරට රාජ්‍යයේ ව්‍යාප්තියට දායක වීම
- 1638 ලන්දේසීන් සමඟ ගිවිසුමක් අස්සන් කිරීම
- 1766 ලන්දේසීන් සමඟ ගිවිසුමක් අස්සන් කිරීම
- සියම් දේශයෙන් භික්ෂූන් ගෙන්වා උපසම්පදාව යළි පිහිටුවීම
- දළදා පෙරහැරට දේවාල පෙරහැර එකතු කිරීම
- වැලිවිට සරණංකර හිමි සංඝරාජ තනතුරට පත් කිරීම
- උඩරට රදළ බලය මර්දනයට දැඩි පියවර ගැනීම
- දළදා මාලිගාවට පත්තිරිප්පුව එකතු කිරීම

**ඇමුණුම 2 (තීරු අලවන ආදර්ශ පත්‍රිකා)**

| පළමු වෙනි විමලධර්මසූරිය රජතුමා | දෙවැනි රාජසිංහ රජතුමා |
| --- | --- |
| | |

| කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා | ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා |
| --- | --- |
| | |

නිපුණතා මට්ටම : මහනුවර රාජධානියේ ආර්ථික හා සංස්කෘතික තොරතුරු ඇසුරින් දේශීයත්වය මතු කර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 06 යි**

**ඉගෙනුම් පල :**

- මහනුවර අවදියේ යැපීම් ක්‍රම විස්තර කරයි
- මහනුවර අවදියේ පැවති ආගමික තත්ත්වය විමර්ශනය කරයි
- මහනුවර අවදියේ වාස්තු විද්‍යාත්මක හා ශිල්ප කලා පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු ඉස්මතු වන සේ පාඩම සැලසුම් කරගන්න

**ආර්ථික රටාව**

- ස්වයංපෝෂිත ආර්ථික රටාවක් පැවතීම
- ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය වීම
- කුඹුරු වගාව, හේන් වගාව, ගෙවතු වගාව හා සත්ත්ව පාලනය
- කඳුකර ප්‍රදේශවල කුඹුරු ගොවිතැන් කිරීමේ දී හෙල්මළු ක්‍රමය යොදා ගැනීම
- අත්තම් ක්‍රමය යොදා ගැනීම
- විවිධ කර්මාන්ත පැවතීම
- ශිල්ප පරම්පරා ක්‍රමයක් ක්‍රියාත්මක වීම
- ප්‍රදේශවලට විශේෂ වූ කර්මාන්ත පැවතීම
- අභ්‍යන්තර හා විදේශ වෙළෙඳාම
  - අභ්‍යන්තර වෙළෙඳාම
  - විදේශ වෙළෙඳාම

**8.1.3. වාස්තු විද්‍යාව හා ශිල්ප කලා**

ගෘහ නිර්මාණය

- ආගමික ගොඩනැඟිලි
  - දළදා මාලිගාව, ඇම්බැක්කේ දේවාලය, ලංකාතිලක විහාරය, ගඩලාදෙණිය හා හින්දු දේවාලය ප්‍රධාන ගෘහනිර්මාණ වීම

- රජ මාලිගා සහ ප්‍රභූ නිවාස (වලවු)
  - චිත්‍ර කලාව
    - * මහනුවර යුගයේ චිත්‍රවල විශේෂ ලක්ෂණ
    - * චිත්‍ර දක්නට ලැබෙන ස්ථාන

- ශිල්ප කලා
  - ඇත් දත්
  - පිත්තල
  - ලාක්ෂා
  - වෙනත් ශිල්ප කලා(පැදුරු,කැටයම් කලාව)

- ආගම හා සමාජය
  - ආගමික තත්ත්වය
    - * බුද්ධාගම
    - * හින්දු ආගම
    - * ඉස්ලාම් ආගම

හෙල්මළු ක්‍රමයට සැකසූ කුඹුරක්



මහනුවර යුගයේ චිත්‍රයක්



- සමාජ තත්ත්වය
    - පවුල් සංස්ථාව
    - කුල ක්‍රමය
    - විවාහය

**මහනුවර යුගයේ ආර්ථික රටාව යන විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම්වලට ශිෂ්‍යයන් යොමු කරන්න.**

**ක්‍රියාකාරකම 01**

- ඇමුණුම 01හි සඳහන් සටහන ඩිමයි කොළයක ඇඳ පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් තුනකට බෙදා ප්‍රධාන ආර්ථික කටයුතු තුන කණ්ඩායම්වලට භාර දෙන්න
- සිසුන් සංඛ්‍යාව වැඩි නම් කණ්ඩායම් ප්‍රමාණය වැඩි කරගන්න
- අනුකොටස්වලට අදාළ තොරතුරු සෙවීමට කණ්ඩායම් සාමාජිකයන්ට පවරන්න. (පෙළ පොත ඇසුරින්)
- සොයාගන්න ලද තොරතුරු පත්‍රිකාවල ලියන්න
- පත්‍රිකා පන්තියට ඉදිරිපත් කොට සාකච්ඡා කරන්න
- නිවැරදි පත්‍රිකා පන්තියේ සියලු දෙනාට ම පෙනෙන පරිදි එල්ලා තබන්න

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01
- ඩිමයි කොළ
- ප්ලැටිග්නම්

ඇමුණුම 01

## මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු

### කෘෂිකර්මාන්තය

| දේශීය වෙළෙඳාම | විදේශීය වෙළෙඳාම | |
|---|---|---|
| වෙළෙඳ ද්‍රව්‍ය | අපනයන ද්‍රව්‍ය | ආනයන ද්‍රව්‍ය |
| .................................. | ............ | ............ |
| .................................. | ............ | ............ |
| .................................. | ........... | ........... |
| .................................. | ........... | ........... |
| .................................. | ........... | ........... |
| .................................. | | |

විශේෂතා

- ..............................................
- .............................................
- .............................................
- .............................................

### කර්මාන්ත

| ප්‍රධාන කර්මාන්ත | පැවති ප්‍රදේශ |
|---|---|
| .................................. | .................................. |
| .................................. | .................................. |
| .................................. | .................................. |
| .................................. | .................................. |
| .................................. | .................................. |
| .................................. | .................................. |
| .................................. | .................................. |

විශේෂතා

- ..............................................
- .............................................
- .............................................
- .............................................

### කෘෂිකර්මාන්තය

| වී වගාව | හේන් වගාව | ගෙවතු වගාව | සත්ත්ව පාලනය |
|---|---|---|---|
| වී වර්ග | බෝග වර්ග | බෝග වර්ග | සත්තු |
| ............. | ............. | ............. | ............. |
| ............. | ............. | ............. | ............. |
| ............. | ............. | ............. | ............. |
| ............. | ............. | ............. | ............. |

විශේෂතා

- ..............................................
- .............................................
- .............................................
- .............................................

**ක්‍රියාකාරම 02**

- මහනුවර යුගයේ වාස්තු විද්‍යා හා කලා ශිල්ප පිළිබඳ ආවරණය වන සේ පහත සඳහන් ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරන්න
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම 1හි සහ 2 හි සඳහන් පින්තූර අධ්‍යයනය කොට ඒ ආශ්‍රිත ව අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න

ඇමුණුම 01



1 මෙම රූපයේ දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?
2 මෙම ගොඩනැගිල්ල පිහිටා ඇති නගරයෙහි නම ලියන්න.
3 මෙම ගොඩනැගිල්ල ඉදි කරවූ රජතුමා කවරෙක් ද?
4 ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා මෙම ගොඩනැගිල්ලට එකතු කළ අංගය කුමක් ද?

ඇමුණුම 02



1. මෙම රූපයේ දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?
2. එහි ඇති විශේෂත්වය කුමක් ද?
3. මෙම ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ කුමන ප්‍රදේශයේ ද?
4. මෙය කුමන රාජධානි සමයට අයත් ද?

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01
- ඇමුණුම 02

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න

- මහනුවර රාජධානියේ වැදගත් ගොඩනැගිලි නම් කරයි
- ආගමික ගොඩනැගිලිවල සුවිශේෂතා ප්‍රකාශ කරයි
- ගොඩනැගිලිවලට අදාළ ප්‍රශ්නවලට නිවැරදි ව උත්තර සපයයි
- නියමිත කාලයට වැඩ අවසන් කරයි
- සහයෝගයෙන් කටයුතු කරයි

**ක්‍රියාකාරකම 03**

**මහනුවර යුගයේ ආගම හා සමාජය යන ක්ෂේත්‍රවලට අදාළ තොරතුරු ආවරණය වන සේ කුඩා පොතක් සකස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදාගන්න
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 01හි කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට බෙදා දෙන්න
- පන්තියේ කණ්ඩායම් සංඛ්‍යාව වැඩි නම් කණ්ඩායම් කිහිපයකට එක් කාර්ය පත්‍රිකාවක් ලබා දෙන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න
- ක්‍රියාකාරකම අවසානයේ දී කණ්ඩායම් විසින් සකස් කරන ලද පොත්වල ඇතුළත් කරුණු විස්තර කිරීමට අවස්ථාව ලබා දෙන්න
- ශිෂ්‍ය දක්ෂතා දුබලතා පෙන්වා දෙන්න
- සකස් කරන ලද පොත් පන්තියේ සියලු දෙනාට ම පරිහරණය කිරීමට හැකි වන සේ තබන්න

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව 01**

- "මහනුවර යුගයේ ආගමික තත්ත්වය" පිළිබඳ තොරතුරු ඇතුළත් කුඩා පොතක් සකස් කරන්න
- පෙළ පොත හා වෙනත් පොත්පත්,සඟරා ආදියෙන් මේ සඳහා තොරතුරු සොයා ගන්න
- අදාළ පින්තූර හා රූප සටහන් ඇතුළු කරමින් වඩාත් නිර්මාණශීලී ව පොත සකස් කරන්න
- කණ්ඩායමේ සියලු දෙනා ම මේ සඳහා සහභාගි කරගන්න
- සකස් කරන ලද පොතෙහි ඇතළත් කරුණු පිළිබඳ විස්තරයක් ගුරුතුමා/තුමිය දැනුම් දෙන දිනයක පන්තියට ඉදිරිපත් කරන්න

**කාර්ය පත්‍රිකාව 02**

- “මහනුවර යුගයේ සමාජ තත්ත්වය“ පිළිබඳ තොරතුරු ඇතුළත් කුඩා පොතක් සකස් කරන්න
- පෙළ පොත හා වෙනත් පොත්පත් සඟරා ආදියෙන් මේ සඳහා තොරතුරු සොයා ගන්න
- අදාල පින්තූර හා රූප සටහන් ඇතුළු කරමින් වඩාත් නිර්මාණශීලී ව පොත සකස් කරන්න
- කණ්ඩායමේ සියලු දෙනා ම මේ සඳහා සහභාගි කරගන්න
- ගුරුතුමා/තුමිය දැනුම් දෙන දිනක දී සකස් කරන ලද පොතෙහි ඇතුළත් කරුණු පිළිබඳ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- මහනුවර යුගයේ ආගමික හා සමාජ තත්ත්වය විස්තර කරයි
- මහනුවර යුගයේ ජනතාව සතු චරිතාකම් පෙන්වා දෙයි
- මහනුවර යුගයෙන් වර්තමානයට ගත හැකි ආදර්ශ විස්තර කරයි
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි
- වඩා නිර්මාණශීලී ව පොත සකස් කරයි

## 8.3 යුරෝපයේ පුනරුද සමය

පුනරුදය යන වචනයේ තේරුම යළි "පිබිදීම" යන්න යි. පැරණි ග්‍රීක - රෝම සංස්කෘති නැවත පණ ලැබුවේය යන අර්ථයෙන් යුරෝපා ඉතිහාසයේ පුනරුදය යන වචනය භාවිත කෙරේ. පසළොස් වන සහ දහසය වන සියවස් යුරෝපයේ ශාස්ත්‍රීය, ආගමික, විද්‍යාත්මක හා කලාත්මක ක්ෂේත්‍රවල සිදු වූ පරිවර්තනය පුනරුදය ලෙස හැඳින්වේ. යුරෝපයේ පුනරුද සමයේ ඇති වූ වර්ධනය හා නව සොයාගැනීම් යුරෝපයේ සංස්කෘතික හා චින්තන සම්ප්‍රදායය වෙනස් මඟකට යොමු කිරීමට මෙන් ම එම අංශවල දීර්ඝ කාලීන ව බලපෑම් ඇති කිරීමට සමත් විය.

**නිපුණතාව** : ඓතිහාසික ගෝලීය ප්‍රවණතාවලින් ශ්‍රී ලංකාව ආභාසය ලබා ඇති ආකාරය විමසා බලා තම උරුමයන් හා අනන්‍යතාව රැකගනමින් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගනියි

**නිපුණතා මට්ටම** : 3.1 යුරෝපයේ ගමන් මඟ වෙනස් කිරීමට පුනරුදය බලපා ඇති ආකාරය විග්‍රහ කරයි

**කාලච්ඡේද** : 12 යි

**ඉගෙනුම් පල** :

- පුනරුදය යන්න පැහැදිලි කරයි
- පුනරුදය ඇති වූ පසුබිම පැහැදිලි කරයි
- ශාස්ත්‍රීය නවෝදය උදාහරණ සහිත ව විස්තර කරයි
- නව රාජාණ්ඩු ක්‍රමයේ බිහි වීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- නව වෙළෙඳ රටාවක් බිහි වන ආකාරය පැහැදිලි කරයි
- නව විද්‍යාත්මක සොයාගැනීම් උදාහරණ සහිත ව පෙන්වා දෙයි
- ආගමික වෙනස් වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- චින්තන රටාවේ ඇති වූ වෙනස සහ එහි බලපෑම සමාජ වෙනස්කම්වලට බලපාන අයුරු පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න

- **පුනරුදයේ පසුබිම**

  පසළොස් වන සහ දහසය වන සියවස්වල යුරෝපයේ ශාස්ත්‍රීය, ආගමික, විද්‍යාත්මක සහ කලාත්මක ක්ෂේත්‍රවල සිදු වූ පරිවර්තනය පුනරුදය ලෙස හැඳින්වේ. මේ අනුව පුනරුදයත් සමඟ පැරණි ග්‍රීක රෝම සංස්කෘතිය නව පණක් ලැබී ය යන අදහස පවතී.

- **පුනරුදයට හේතු**
  - කොන්ස්තන්තිනෝපල් නගරය ඔටෝමන් තුර්කිවරුන්ගේ බලයට යටත් වීම සහ එමඟින් පෙර අපර දෙදිග වෙළෙඳාමට බාධා එල්ල වීම
  - වෙළෙඳාම දියුණු වීම හා ධනවතුන් පිරිසක් බිහි වීම
  - බුද්ධි ප්‍රබෝධය

- **පුනරුදය ඇතිවීම**

  **බුද්ධි ප්‍රබෝධය**
  - විශ්ව විද්‍යාලය ව්‍යාප්ත වීම සහ උගතුන් බිහි වීම
  - ග්‍රීක හා ලතින් භාෂාවල නව ප්‍රබෝධයක් ඇති වීම
  - මෙකල සිටි ගත් කතුවරු

    ඩාන්ටේ, පෙට්රාක්, බොකෑෂියෝ (ඉතාලිය)

    තෝමස් මුවර්, ෆ්‍රැන්සිස් බේකන් (එංගලන්තය)

- **මානවවාදය ඉස්මතු වීම**

- **කලා ශිල්ප**
  - කලාකරුවන් ස්වාධීන ව තම දක්ෂතා ඉස්මතු කරමින් නිර්මාණ බිහි කිරීම.
  - ලෞකික රසවින්දනයට නැඹුරු වූ ධනවතුන් කලා ශිල්ප වර්ධනයට අනුග්‍රහය දැක්වීම

- **චිත්‍ර කලාව, මූර්ති කලාව හා ගෘහ නිර්මාණ**

  - **චිත්‍ර කලාව**
    - ඉතාලියේ ෆ්ලෝරන්ස් නගරය  නව චිත්‍ර කලාවන් බිහි කළ මධ්‍යස්ථානයක් වීම
    - ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ආන්ජලෝ, රෆායල් ආදි කලාකරුවන් බිහි වීම

  - **මූර්ති කලාව**
    - කිරි ගරුඬින් ප්‍රතිමා නෙළීම
    - මයිකල් ඇන්ජලෝ අග්‍රගණ්‍ය ප්‍රතිමා ශිල්පියකු වීම

  - **ගෘහ නිර්මාණ**
    - රෝම ගෘහ නිර්මාණ ශිල්පය


  - **ආගමික ප්‍රතිසංස්කරණ**
    - කතෝලික සභාවේ දුර්වලතා විවේචනයට ලක් වීම
    - මාර්ටින් ලූතර් සහ ජෝන් කැල්වින් මූලිකත්වය ගෙන කටයුතු කිරීම

  - **නව විද්‍යාත්මක සොයාගැනීම්**
    - විශ්වය පිළිබඳ නව මත ප්‍රචලිත වීම
      පෘථිවි කේන්ද්‍රීයවාදය වෙනුවට සූර්යය කේන්ද්‍රීයවාදය ඉදිරිපත් වීම
    - විශ්වය පිළිබඳ ව ඉදිරිපත් වූ නව මත
      * නිකලස් කොපර්නිකස් - ග්‍රහලෝක සූර්යා වටා ගමන් කරන බව පැහැදිලි කිරීම
      * ගැලීලියෝ ගැලිලි - දුරදක්නය සොයා ගැනීම, සෞරග්‍රහ මණ්ඩලයේ නවග්‍රහයන් සොයා ගැනීම
      * ජොහැන්නස් කෙප්ලර් - ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාර මඟක ගමන් කරන බව සොයා ගැනීම
      * සර් අයිසෙක් නිව්ටන් - ගුරුත්වාකර්ෂණ නියමය ඉදිරිපත් කිරීම

  - **වෛද්‍ය විද්‍යාව**
    - පැරසල්සස් - විවිධ පරිසර පද්ධති යටතේ ලෙඩ රෝග වැළඳීමට හේතු හා ප්‍රතිකාර අධ්‍යයනය කිරීම
      * මයිකල් සර්වේට්ස්, විලියම් හාවේ - රුධිර සංසරණ පද්ධතිය සොයා ගැනීම

  - **වෙනත්**
    - චීනයෙන් බටහිරට ගෙන ගිය මුද්‍රණ ශිල්පය ඇසුරින් ජොහැන්නස් ගුටෙන්බර්ග් මුද්‍රණ යන්ත්‍රය නිපදවීම

පියෙටා ප්‍රතිමාව



**පුනරුද සමයේ චිත්‍රයක්**



**ක්‍රියාකාරකම 1**

**ඉහත සඳහන් විෂය කරුණු ඇසුරින් කෙටි ප්‍රශ්නෝත්තර පොතක් සකස් කිරීම**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදාගන්න
- "පුනරුදය" යන පාඩම ඇසුරින් ප්‍රශ්න සකස් කළ යුතු බව දන්වන්න
- ක්‍රියාකාරකම පිළිබඳ හැඳින්වීමක් සහ කළ යුතු කාර්යයන් පිළිබඳ ව උපදෙස් දෙන්න
- ප්‍රශ්න පොත සැකසීම සඳහා අවශ්‍ය ප්‍රශ්න නිවසේ දී ම සකස් කරගෙන ඒමට අවස්ථාව දෙන්න
- සකස් කළ යුතු උපරිම ප්‍රශ්න සංඛ්‍යාව නියම කරන්න
- ඇමුණුම 01හි සඳහන් ආදර්ශ ප්‍රශ්න ද ශිෂ්‍යයන්ට කියාදෙන්න
- ප්‍රශ්නෝත්තර පොත නිර්මාණාත්මක ව සකස් කිරීමට උපදෙස් දෙන්න
- ශිෂ්‍යයන් සැකසූ ප්‍රශ්නෝත්තර නිරීක්ෂණය කර අඩුපාඩු පෙන්වා දෙන්න
- ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට බෙදා ප්‍රශ්නෝත්තර පොත් ඇසුරින් ප්‍රශ්න විචාරාත්මක තරගයක් පවත්වන්න

**ඇමුණුම 01**

**ආදර්ශ කෙටි ප්‍රශ්න**

1. පුනරුදය යනු කුමක් ද
2. පුනරුද සමයේ චිත්‍ර කලාවේ ඇති වූ වෙනස්කම් දෙකක් ලියන්න
3. යුරෝපයේ පුනරුද සමයේ සිටි උසස් චිත්‍ර ශිල්පියකු නම් කරන්න
4. පුනරුද අවදියේ බිහිවූ විශිෂ්ට චිත්‍ර දෙකක් නම් කරන්න
5. මයිකල් ඇන්ජලෝ නිර්මාණය කළ විශිෂ්ට මූර්ති දෙකක් නම් කරන්න
6. ග්‍රහ ලෝක සූර්යයා වටා ඉලිප්සාකාර ව ගමන් කරන බව සොයාගත් විද්‍යාඥයා කවරෙක් ද ?

**ඇගයීම හා තක්සේරුකරණය**

- . පුනරුදය පාඩමට අදාළ ප්‍රශ්න සකස් කරයි
- නිවැරදි ප්‍රශ්න ප්‍රමාණවත් ව සකස් කරයි
- ප්‍රශ්න විචාරාත්මක තරගයක් සඳහා සහභාගි වෙයි
- සහයෝගයෙන් කටයුතු කරයි
- . ගුරු උපදෙස් පිළිපදියි

**ක්‍රියාකාරකම 02**

**ඉහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පුනරුදයේ චිත්‍ර සහ පින්තූර දැක්වෙන ප්‍රදර්ශන පුවරුවක් සකස් කිරීම**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ශිෂ්‍යයන් කණ්ඩායම් හතරකට බෙදන්න
  (ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි නම් කණ්ඩායම් සංඛ්‍යාව වැඩි කර නිර්මාණ සකස් කරන්න)
- එක් එක් කණ්ඩායම සඳහා ඇමුණුම 02හි සඳහන් මාතෘකා ලබා දෙන්න
- ලබා දී ඇති තේමාවලට අදාළ පින්තූර/චිත්‍ර එකතු කරන ලෙස ශිෂ්‍යයන් දැනුම්වත් කරන්න
- ක්‍රියාකාරකම පවත්වන දිනය පිළිබඳ ව සතියකට පෙර දැනුම් දෙන්න
- නියමිත දිනයේ දී රැස් කරගත් පින්තූර රැගෙන එන ලෙස දැනුම් දෙන්න
- බොක්ස් බෝඩයක් සූදානම් කරගන්න. එය ඇමුණුමේ සඳහන් තේමා හතරට බෙදන්න
- තේමාවලට අදාළ පින්තූර/චිත්‍ර එහි ඇලවීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න
- එම පින්තූර හෝ චිත්‍ර හෝ නම් කර ඊට අදාළ ව වැදගත් වන වගන්ති ද ලිවීමට උපදෙස් දෙන්න
- නිර්මාණ සංග්‍රහය පන්තියේ ප්‍රදර්ශනය කර තබන්න

**ගුණාත්මක යෙදවුම්**

බොක්ස් බෝඩ්, ගම්, ප්ලැටිග්නම්

**ඇගයීම හා තක්සේරුකරණය**

- පුනරුද සමයේ නව නිර්මාණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- පුනරුද සමයේ නිර්මාණ ඇතුළත් පින්තූර සංග්‍රහයක් සකස් කරයි
- පුනරුද සමයේ නව සොයාගැනීම අගය කරයි
- කණ්ඩායමක් ලෙස සාමූහික ව කටයුතු කරයි
- කාර්යය සාර්ථක කරගැනීම සඳහා උනන්දුවෙන් කටයුතු කරයි

**ඇමුණුම 02**

**ප්‍රදර්ශන පුවරුව සකස් කිරීම සඳහා තේමා**

01. පුනරුද සමයේ චිත්‍ර කලාව
02. පුනරුද සමයේ ප්‍රතිමා කලාව
03. පුනරුද සමයේ ගෘහ නිර්මාණ කලාව
04. පුනරුද සමයේ නව විද්‍යාත්මක සොයාගැනීම්

## 8.4 දේශ ගවේෂණය හා යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම

යුරෝපා ජාතීන් විවිධ රටවල් සොයා ගැනීම දේශ ගවේෂණය ලෙස හඳුන්වා දිය හැකි ය. මෙම දේශ ගවේෂණ ව්‍යාපාරය හේතුවෙන් පසළොස් වන සියවසයේ අග භාගය වන විට ලෝකයේ විශාල ප්‍රදේශයක් යුරෝපා බලපැම්වලට යටත් විය. යුරෝපීයයන් විසින් ආසියා, අප්‍රිකා හා ඇමෙරිකා මහද්වීපවල විවිධ ප්‍රදේශ ගවේෂණය කර ඒවා යටත් කරගනිමින් ඒවායේ සම්පත් යුරෝපය වෙත ගෙනයනු ලැබී ය. යුරෝපීයයන් දේශ ගවේෂණයට යොමු වීම, සොයාගත් රටවල්, ඒ සඳහා යොමු වූවන් හා එහි ප්‍රතිඵල පිළිබඳ ව මෙම ඒකකයේ දී අවධානයට යොමු කර ඇත.

**නිපුණතාව :**

ඓතිහාසික ගෝලීය ප්‍රවණතාවලින් මෙරට ආභාසය ලබා ඇති ආකාරය විමසා බලා තම උරුමය හා අනන්‍යතාව රැකගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගනි යි

**නිපුණතා මට්ටම :**

4.1 යුරෝපයේ ඇති වූ දේශ ගවේෂණ ව්‍යාපාරය විග්‍රහ කරයි

**කාලච්ඡේද 08 යි**

**ඉගෙනුම් පල :**

- දේශ ගවේෂණ ව්‍යාපාර පැහැදිලි කරයි
- දේශ ගවේෂණ ව්‍යාපාරයට හේතු දක්වයි
- දේශ ගවේෂණයට සම්බන්ධ පුද්ගලයන් සහ රටවල් නම් කරයි
- වෙළෙඳ මාර්ග ඔස්සේ නව රටවල් සොයාගත් ආකාරය පෙන්වා දෙයි
- යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- දේශ ගවේෂණ ව්‍යාපාර දැක්වෙන ප්‍රධාන මාර්ග, රටවල් සහ ස්ථාන සිතියමක ලකුණු කර නම් කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න

- දේශ ගවේෂණ කටයුතුවල පසුබිම
  යුරෝපා ජාතීන් නව මුහුදු මාර්ග යොදා ගනිමින් ලෝකයේ එතෙක් හඳුනා නොගත් රටවල් සහ නව මුහුදු සොයා ගැනීම දේශ ගවේෂණය ලෙස හැඳින්වේ

- දේශ ගවේෂණ කටයුතු සඳහා බලපෑ සාධක
  - පෙර, අපර දෙදිග ගොඩබිම් වෙළෙඳ මාර්ග අවහිර වීම
  - ප්‍රෙස්ටර් ජෝන් නම් ක්‍රිස්තු රාජ්‍ය සොයා යාම
  - දේශ ගවේෂණය සඳහා සුදුසු පරිසරයක් යුරෝපය තුළ ගොඩනැගී තිබීම
  - රාජ්‍ය අනුග්‍රහය ලැබීම

- දේශ ගවේෂණ කටයුතු හා සම්බන්ධ පුද්ගලයෝ
    - බර්තොලමියු දියෙස්
    - වස්කෝදගාමා
    - ක්‍රිස්ටෝපර් කොලම්බස්
    - අමෙරිගෝ වෙස්පුචි
    - පර්ඩිනන්ඩ් මැගලන්
    - වස්කෝ නියුනෙස් බැල්බෝවා
    - ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ
    - පර්නැන්ඩෝ කෝර්ටේස්
    - ජෝන් කැබෝ
    - ජැක්විස් කාටියර් (ප්‍රංශ ජාතික)
    - චැම්ප්ලේන් මාක්විටේ (ප්‍රංශ ජාතික)
    - හෙන්රි හඩ්සන්

- දේශ ගවේෂණ කටයුතුවලට යොමු වූ රටවල්
    - පෘතුගාලය
    - ස්පාඤ්ඤය
    - ඕලන්දය
    - එංගලන්තය
    - ප්‍රංශය

- පෙරදිගට යාමට ගත් ප්‍රයත්නයේ දී සොයාගන්නා ලද නව සමුද්‍ර මාර්ග හා රටවල්
    - අමෙරිකාව
    - බ්‍රසීලය
    - සුබපැත්මේ තුඩුව
    - බටහිර ඉන්දීය දූපත්
    - ඉන්දියාව

- යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම
    - මුස්ලිම්වරුන් සතු ව පැවති පෙරදිග වෙළෙඳ බලය යුරෝපීයයන් විසින් අත්පත් කරගැනීම
    - ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීම
    - ආසියාවට පැමිණි යුරෝපා ජාතීහු
        * පෘතුගීසීන්
        * ලන්දේසීන්
        * ප්‍රංශවරුන්
        * බ්‍රිතාන්‍යයන්

**ක්‍රියාකාරකම**

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම 01හි ඇතුළත් කාර්ය පත්‍රිකා ශිෂ්‍යයන්ට ලබා දෙන්න
- දී ඇති උපදෙස් පරිදි ක්‍රියාකාරකමෙහි යොදවන්න

| |
|---|
| **කාර්ය පත්‍රිකා-කණ්ඩායම් 01**<br><br>ලෝක ආකෘති සිතියමක දේශ ගවේෂණ කටයුතුවලට යොමු වූ යුරෝපා රටවල් වර්ණ කර නම් කරන්න<br>- පෘතුගාලය<br>- ඕලන්දය(නෙදර්ලන්තය)<br>- ස්පාඤ්ඤය<br>- ප්‍රංශය<br>- එංගලන්තය |
| **කාර්ය පත්‍රිකා-කණ්ඩායම් 02**<br><br>• යුරෝපීය ජාතීන් පෙරදිගට පැමිණි මාර්ගය ලෝක සිතියමක ඇඳ පෙන්වන්න<br>• පෙර අපර දෙදිග සම්බන්ධ කළ මුහුදු මාර්ගයේ වැදගත් ස්ථාන ලෝක ආකෘති සිතියමේ ලකුණු කර නම් කරන්න |
| **කාර්ය පත්‍රිකා-කණ්ඩායම් 03**<br><br>• යුරෝපා ජාතීන් දේශ ගවේෂණ කටයුතුවලට යොමු වූ හේතු ලියා  දක්වන්න<br>• යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම පිළිබඳ ව කෙටි සටහනක් ලියන්න |
| **කාර්ය පත්‍රිකා-කණ්ඩායම් 04**<br><br>• යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම පිළිබඳ රචනයක් ලිවීම සඳහා කරුණු පෙළ ගස්වන්න |

**ගුණාත්මක යෙදවුම් :**

- ලෝක ආකෘති සිතියම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
පහත සඳහන් නිර්ණායක ඇසුරෙන් ඇගයීම හා තක්සේරුකරණය කරන්න

- දේශ ගවේෂණයට යොමු වූ යුරෝපා රටවල් සහ මුහුදු මාර්ග හඳුනා ගෙන නිවැරදි ව සිතියම් ගත කරයි
- යුරෝපා ජාතීන් දේශ ගවේෂණ කටයුතුවලට යොමු වූ හේතු දක්වයි
- දේශ ගවේෂණ කටයුතුවල ඇති වැදගත්කම පිළිබඳ ව කතා කරයි
- දී ඇති උපදෙස් අනුව කටයුතු කරයි
- කණ්ඩායම් තුළ සහයෝගයෙන් කටයුතු කරයි

## 8.5 ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසීන් යටතට පත්වීම

පසළොස් වන සියවස අවසානය වන විට යුරෝපා ජාතීහු විවිධ අරමුණු ඔස්සේ පෙරදිග ප්‍රදේශවලට පැමිණියහ. අතුරෙන් පෘතුගීසිහු ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම යුරෝපා ජාතිය වූහ. 16 වන සියවසේ මුල් කාලයේ සිදු වූ පෘතුගීසින් ආගමනයත් සමග මෙරට දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍රවල විවිධ වෙනස්කම් ඇතිවීමට කරුණු සැලසිණි. පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණීමට බලපෑ හේතු, ඔවුන් පැමිණෙන විට මෙරට පැවති දේශපාලන තත්ත්වය සහ ශ්‍රී ලංකාව තුළ පෘතුගීසි බල ව්‍යාප්තිය පිළිබඳ ව මෙම ඒකකයෙන් අවධානය යොමු කෙරේ. එමෙන් ම පෘතුගීසින් යාපනය හා උඩරට රාජ්‍යය සමඟ පැවැත්වූ සබඳතා මෙන් ම පෘතුගීසි පාලනය හේතු කොටගෙන ලංකාවේ ඇති වූ සමාජ, ආර්ථික, සංස්කෘතික බලපෑම් පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කර ඇත.

**නිපුණතාවය :**

රටක විදේශ ආධිපත්‍යය ගොඩනැගීම සඳහා බලපාන සාධක බටහිර ජාතීන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම ඇසුරෙන් විමර්ශනය කරයි

**නිපුණතා මට්ටම**

5.1.පෘතුගීසින් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගත් ආකාරය පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව : 07 යි**

**ඉගෙනුම් පල :**

- පෘතුගීසින් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු දක්වයි
- පෘතුගීසින් පැමිණෙන විට මෙරට දේශපාලන තත්ත්වය විස්තර කරයි
- පෘතුගීසින් මුහුදුබඩ පළාත්වල බලය පිහිටුවීමේ අවස්ථා පැහැදිලි කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න

**5.1 පෘතුගීසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල බලය පිහිටුවා ගැනීම**

- පෘතුගීසින් ශ්‍රී ලංකාවට අවධානය යොමු කිරීම
  - පෘතුගීසින් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු
  - 1505 දී ලොරෙන්සෝ ද අල්මේදා ශ්‍රී ලංකාවට පැමිණීම

- පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණෙන විට මෙරට දේශපාලන තත්ත්වය
  - ශ්‍රී ලංකාව රාජ්‍ය තුනකට බෙදී තිබීම - කෝට්ටේ, කන්ද උඩරට, යාපනය

- පෘතුගීසින් කෝට්ටේ හා සීතාවක සමඟ පැවැත්වූ සබඳතා
  - 1521 විජයබා කොල්ලය
  - මායාදුන්නේ රජු සහ බුවනෙකබාහු රජු අතර ඇති වූ ගැටුම් සහ පෘතුගීසි මැදිහත්වීම්
  - ධර්මපාල කුමරුගේ පිළිරුව පෘතුගාලයට යවා ඔටුනු පැළඳවීම
  - බුවනෙකබාහු රජුගේ අභාවය
  - ධර්මපාල කුමරු රාජ්‍යත්වයට පත් වීම
  - ධර්මපාල රජු සහ පෘතුගීසින් කොළඹ කොටුවට සීමා වීම
  - ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජධානිය පෘතුගීසින්ට පවරා දීම

**සීතාවක රාජධානිය**

- මායාදුන්නේ රජුගේ ක්‍රියාකලාපය හා සීතාවක බලය වර්ධනය වීම
- මුල්ලේරියාවේ සටන
- සීතාවක බල ව්‍යාප්තිය - රයිගම ඈඳා ගැනීම, උඩරට ඈඳා ගැනීම
- පළමු වන රාජසිංහ රජතුමාගේ පෘතුගීසි විරෝධී කටයුතු
- සීතාවක රාජ්‍යයේ පිරිහීම හා පෘතුගීසින් එය අත්කර ගැනීම

- පෘතුගීසීන් උඩරට රාජ්‍ය සමඟ පැවැත්වූ සබඳතා
  - උඩරට රජවරුන් පෘතුගීසින් සමඟ පැවැත්වූ සබඳතා
  - සාමකාමී සබඳතා
    උදා- කෝට්ටේ හා සීතාවක රාජධානිවලින් එල්ල වූ අභියෝගවලට මුහුණ දීම සඳහා උඩරට රජවරුන් පෘතුගීසි සහාය ලබා ගැනීම
  - උඩරට ආක්‍රමණ - දන්තුරේ, බලන, රන්දෙණිවෙල, ගන්නෝරුව සටන්
  - යාපනයේ රජු සමග පෘතුගීසීන් පැවැත්වූ සම්බන්ධතා

**ක්‍රියාකාරකම 01**
**ඉහත විෂය කරුණු ඉස්මතු වන සේ පහත ක්‍රියාකාරකම කරවන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදාගන්න
- ඇමුණුම 01හි සඳහන් සිතියම ශිෂ්‍යයන්ට බෙදා දෙන්න
- ඇමුණුම 02හි සඳහන් ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න


**ගුණාත්මක යෙදවුම්**

ලංකා සිතියම් - ඇමුණුම 01

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පෘතුගීසින් පැමිණෙන විට ලංකාවේ පැවති දේශපාලන ඒකක නම් කරයි
- වර්ෂ 1521න් පසු කෝට්ටේ රාජ්‍යය බෙදී ගිය ආකාරය පැහැදිලි කරයි
- දේශපාලන ඒකක වෙන් වී තිබූ ආකාරය පැහැදිලි කරයි
- සිතියම් ලකුණු කිරීමේ නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරයි
- නියමිත කාලය තුළ දී කාර්යය නිම කරයි

ඇමුණුම 01



79°30'0"E
80°0'0"E
80°30'0"E
81°0'0"E
81°30'0"E
82°0'0"E
9°30'0"N
9°0'0"N
8°30'0"N
8°0'0"N
7°30'0"N
7°0'0"N
6°30'0"N
6°0'0"N
N
W
E
S
0 10 20 40
කිලෝමීටර

**ඇමුණුම 2 - උපදෙස් පත්‍රිකාව**

- ඔබ වෙත සපයා ඇති සිතියමේ කෝට්ටේ, සීතාවක හා රයිගම රාජධානිවල දේශ සීමා රතු පාටින් අඳින්න
- එම රාජධානි නම් කරන්න
- සිතියම් පොත හා පෙළ පොත ආධාර කරගෙන කෝට්ටේ රාජ්‍යයට අයත් ප්‍රදේශ කහ පාටින් ද, මහනුවර රාජ්‍යයට අයත් ප්‍රදේශ ළා කොළ පාටින් ද, යාපනය රාජ්‍යයට අයත් ප්‍රදේශ රෝස පාටින් ද පාට කරන්න
- පහත දැක්වෙන ස්ථාන සිතියම තුළ ලකුණු කරන්න
  කොළඹ, කෝට්ටේ, කොට්ටියාරම, මන්නාරම, ගාල්ල, මහනුවර, යාපනය

**ක්‍රියාකාරකම 02**
**සිතියම් ලකුණු කිරීමට අමතර ව පහත සඳහන් ක්‍රියාකාරකම පන්තියේ සිදු කරන්න**

**පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණීම හා කෝට්ටේ, මහනුවර, යාපනය රාජධානි සමඟ සම්බන්ධතා පැවැත්වූ ආකාරය ඇසුරින් ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් පවත්වන්න**

- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදන්න
- කණ්ඩායම් සඳහා නායකයකු පත් කරන්න
- පාඩමට අදාළ ව හැකි තරම් ප්‍රශ්න සැකසීමට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.
- සකස් කළ ප්‍රශ්න උත්තර ද සමඟින් සටහන් කිරීමට උපදෙස් දෙන්න
- ප්‍රශ්න සැකසීම සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න
- මී ළඟ කාලපරිච්ඡේදයේ දී ප්‍රශ්න විචාරාත්මක තරගය පවත්වන්න
- ප්‍රශ්න විචාරාත්මක තරගය සඳහා අවශ්‍ය නීති රීති හා ලකුණු දීමේ පටිපාටියක් සමඟ සුදුසු පරිදි කොන්දේසි සකස් කර ගන්න
- සටහන් කරගන්නා ලද ප්‍රශ්න කණ්ඩායම් නායකයන් විසින් ප්‍රතිවාදී පිල වෙත යොමු කරවන්න
- දෙපිලෙහි ලකුණු හුණු පුවරුවේ සටහන් කරන්න
- සැම ශිෂ්‍යයකු ම සහභාගි කරවමින් ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන පවත්වන්න
- ශිෂ්‍ය දුබලතා හා දක්ෂතා පෙන්වා දෙමින් පාඩම සමාලෝචනය කරන්න

**පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණීම සහ කෝට්ටේ, මහනුවර, යාපනය රාජධානි සමඟ පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරයි
- පෘතුගීසි බලය මුහුදුබඩ ප්‍රදේශවල තහවුරු වීමට හේතු දක්වයි
- විෂය අන්තර්ගතයට අදාළ ව ප්‍රශ්න හා උත්තර සකස් කිරීමේ හුරුව ලබයි
- කණ්ඩායම තුළ සහයෝගයෙන් වැඩ කරයි
- ජය පරාජය සම සේ විඳ ගනියි

**නිපුණතා මට්ටම:** 5.2 පෘතුගීසින්ගේ පාලනය, ආර්ථික සහ සංස්කෘතික කටයුතු මෙරට ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය විග්‍රහ කරයි

**කාලච්ඡේද :** 03 යි

**ඉගෙනුම් පල :**

- ශ්‍රී ලංකාව තුළ පෘතුගීසි පාලනයේ ස්වභාවය පෙන්වා දෙයි
- පෘතුගීසින් යටතේ ආර්ථික කටයුතු විස්තර කරයි
- පෘතුගීසි පාලනයෙන් මෙරට සංස්කෘතියට එක් වූ නවාංග පැහැදිලි කරයි

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න

**5.2 පෘතුගීසීන්ගේ දේශපාලන ආර්ථික සමාජ හා සංස්කෘතික කටයුතු**

- පෘතුගීසින්ගේ පාලනය
  - පෘතුගීසි පාලනයේ විශේෂ ලක්ෂණ

- ආර්ථික කටයුතු
  - තම පාලන ප්‍රදේශවල වෙළෙඳාම ප්‍රචලිත කිරීම
  - කුළුබඩු, පුවක්, ඇත් දළ, මුතු මැණික් ප්‍රධාන වෙළෙඳ ද්‍රව්‍ය වීම

- සමාජ හා සංස්කෘතික කටයුතු
  - රෝමානු කතෝලික ආගම මෙරට ව්‍යාප්ත වීම
  - මිෂනාරි පූජකයන් මගින් ආගමික අධ්‍යාපනය ලබා දීම
  - සුභසාධන සේවාවන් ආරම්භ කිරීම
    උදා- ස්පිරිටල් මඩම
  - වෙනත් සංස්කෘතික අංග එකතු වීම
    උදා- ඇඳුම්, ආහාර, පෙළපත් නාම, සංගීතය, කලාව

**ක්‍රියාකාරකම**

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම සඳහා සිසුන් යොමු කරන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදාගන්න
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- ඇමුණුම 01හි කාර්ය පත්‍රිකා කණ්ඩායම් වෙත ලබා දෙන්න
- පන්තියේ කණ්ඩායම් සංඛ්‍යාව වැඩි නම් එක් ක්‍රියාකාරකමක් කණ්ඩායම් කිහිපයක් වෙත ලබා දෙන්න
- ක්‍රියාකාරකම අවසානයේ එය පන්තිය වෙත ඉදිරිපත් කරවන්න
- ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇසුරින් දුබලතා, දක්ෂතා පෙන්වා දෙමින් පාඩම සමාලෝචනය කරන්න

- පෘතුගීසින්ගේ පාලන, ආර්ථික හා සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- පෘතුගීසි බලපෑමෙන් මෙරට සමාජයට එක්වූ නවාංග පෙන්වා දෙයි
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි
- නිවැරැදි තොරතුරු ඉදිරිපත් කරයි
- ක්‍රියාකාරකම් නිමවුම වඩා නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි

**ගුණාත්මක යෙදවුම්**

**ඇමුණුම 01**

| |
|---|
| **කණ්ඩායම් 01 : කාර්ය පත්‍රිකාව**<br>• පෙළ පොත ඇසුරින් පෘතුගීසින්ගේ පාලන කටයුතු පිළිබඳ තොරතුරු සොයා ගන්න<br>• ඒවා ඇසුරින් පෘතුගීසි පාලනය පිළිබඳ ව පන්තියට ඉදිරිපත් කිරීමට කථාවක් සූදානම් කරගන්න<br>• කණ්ඩායමේ සියලු දෙනාගේ සහයෝගයෙන් කථාව පන්තියට ඉදිරිපත් කරන්න |
| **කණ්ඩායම 02 : කාර්ය පත්‍රිකාව**<br>• පෙළ පොත ඇසුරෙන් පෘතුගීසින්ගේ ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු සොයා ගන්න<br>• පෘතුගීසින්ගේ ආර්ථික කටයුතු ඇසුරෙන් කථාවක් සූදානම් කර ගන්න<br>• කණ්ඩායමේ සියලු දෙනාගේ සහයෝගයෙන් කථාව පන්තියට ඉදිරිපත් කරන්න |
| **කණ්ඩායම 03 : කාර්ය පත්‍රිකාව**<br>• පෙළ පොත ඇසුරෙන් පෘතුගීසින්ගේ සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු සොයා ගන්න<br>• පෘතුගීසින්ගේ සමාජ සංස්කෘතික කටයුතු ඇසුරෙන් කථාවක් සූදානම් කර ගන්න<br>• කණ්ඩායමේ සියලු දෙනාගේ සහයෝගයෙන් කථාව පන්තියට ඉදිරිපත් කරන්න |